(161)

" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 SYSTEM CERTIFIED · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/PTR/1 /FI/60 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } | දිනය / திகதி / Date } 2023.07.17

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභාව
ලේකම් ( පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය ) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් තනතුරු සඳහා ස්ථිරවම මුදා හැරීම</u>

උක්ත කරුණට අදාළ ව ~~මෙතෙක්~~ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබාදීම 2023.08.29 දිනෙන් අවසන් කරන බවත් නැවත කිසිදු හේතුවක් මත එම කාලය දීර්ඝ නොකරන බවත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක WPC/PSC/TRF/04/3/2-21(1) හා 2023.07.12 දිනැති ලිපියෙන් දන්වා එවා ඇත. එම ලිපියේ පිටපත පසුපිටෙහි ඇති අතර අදාළ ඇමුණුම pt.chiefsec.wp.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගන්නා ලෙස කාරුණික ව දන්වමි

02. ඒ අනුව මෙතෙක් අනුමැතියට ඉදිරිපත් නොකළ සියලුම ස්ථිර මුදාහැරීම් උක්ත ලිපියේ සඳහන් පිරික්සුම් ලැයිස්තුව ප්‍රකාර ව සකස් කර, 2023.08.25 දිනට පෙර එම කොමිෂන් සභාව වෙත යොමු කිරීමට හැකිවන සේ 2023.08.18 දිනට පෙර මෙම කාර්යාලය වෙත එවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි.

ආර්.සී.ඉන්දිකා
සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත.

O/C
7/17



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640 Fax : 0112092636 dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532 Fax : 0112092533 dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501 Fax : 0112092505 dcs@eng.wpc.gov.lk | Tel : 0112092628 Fax : 0112092625 cia@cs.wpc.gov.lk |

විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/TRF/04/3/2-21 (I) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.07. 12 |

14 JUL 2023

ප්‍රධාන ලේකම්,

බස්නාහිර පළාත

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් වෙනුවෙන් නව තනතුරු සඳහා</u>**

**<u>දරණ ලද තනතුරින් ස්ථිරව මුදාහැරීම</u>**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හා සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ 2023.07.11 දින පවත්වන ලද සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණය පරිදි මෙතෙක් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් නොවූ සියලුම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතට ගැනෙන ස්ථිර මුදාහැරීම්වලට අදාළ අනුමැතිය ලබාදීමේ කාර්යය 2023.08.29 දිනෙන් අවසන් කිරීමටත්, නැවත කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකිරීමටත්, 2023.08.29 දිනෙන් පසුව ඉදිරිපත් වන ස්ථිර මුදාහැරීම් ප්‍රතික්ෂේප කිරීමටත් තීරණය කරන ලදී.

02. ඒ අනුව, මෙතෙක් අනුමැතියට ඉදිරිපත් නොවූ සියලුම ස්ථිර මුදාහැරීම් මේ සමඟ අමුණා ඇති පිරික්සුම් ලැයිස්තුවේ සඳහන් සියලු ලිපිලේඛන සමඟ <u>2023.08.25 දිනට පෙර</u> මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

තිලක් සෙනරත්,

ලේකම්,

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

011-2879613-14

ෆැක්ස් 011-2879512

ppscwptrf@sltnet.lk

පිටපත : සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් : කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

(අධ්‍යාපන/සෞඛ්‍ය/මාර්ග හා ප්‍රවාහන/කෘෂිකර්ම/පළාත් පාලන)

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් නව තනතුරු සඳහා ස්ථිරවම මුදාහැරීම**

**පිරික්සුම් ලැයිස්තුව (Check List)**

| අනු අංකය | ලේඛනය | ඇත | නැත | වෙනත් |
|---|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 130 වගන්තිය අනුව 10 පරිශිෂ්ටය | | | |
| 2. | නිලධරයාගේ මුල් පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 3. | නිලධරයාගේ මුල් පත්වීම ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 4. | බස්නාහිර පළාත් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (i) අනුව අදාළ නිලධරයා පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර කර නොමැති විට, 131 (ii) අනුව පළාත් සභා රාජ්‍ය සේවයෙන් මුදාහරින ලෙස ඉල්ලා සිටින දින වන විට සමත්ව සිටිය යුතු දෙපාර්තමේන්තු පරීක්ෂණ හෝ කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණ සමත් වී නොමැති විට අදාළ ආයතන ප්‍රධානී විසින් මුදාහැරීම නිර්දේශ කිරීමේ සහතිකය | | | |
| 5. | නිලධරයාගේ මුල් පත්වීම් ලිපිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නොවේ නම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පත්කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය) | | | |
| 6. | නිලධරයා රාජකාරීවලින් නිදහස් කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 7. | නිලධරයා නව තනතුරට පත්කිරීමේ විධිමත් පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 8. | නිලධරයා නව තනතුරේ රාජකාරී භාරගැනීමේ ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 9. | බස්නාහිර පළාත් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (iii) සිට (xii) දක්වා කරුණු සපුරා ඇති බැවින් නිලධරයා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අදාළ තනතුරින් මුදාහැරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීගේ සහතිකය | | | |
| 10. | බස්නාහිර පළාත් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (xiii) අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයා සේවය කරමින් සිටින දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟත්වය සහිත ලිපිය | | | |

**වෙනත්**

11. ……………………………………………………………………………

12. ……………………………………………………………………………